# අධ්‍යාපන සමාජ විද්‍යාවේ ආරම්භය හා විකාශනය

ඉඹුලමුරේ විමලරතන හිමි

## හැඳින්වීම

අධ්‍යාපන සමාජ විද්‍යාව සමාජීය විද්‍යා අධ්‍යයන විෂය ධාරාවේ පවතින සුවිශේෂී විෂය ධාරාවකි. මානව පරිණාමයේ දී සමාජය පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා ප්‍රාථමික සමාජවල ද විවිධ ගවේෂණාත්මක අධ්‍යයන අවිධිමත් ව සිදු වී ඇත. විද්‍යාවේ දියුණුවත් සමඟ එකී අවිධිමත් අධ්‍යයන, විද්‍යාත්මක අධ්‍යයන දක්වා අර්ථාන්විත ව සකස් වූ අතර ඒවා විවිධ ශාඛා නිර්මාණය කරමින් විවිධ ප්‍රවේශ ඔස්සේ සංවර්ධනය විය. ඒ අනුව අධ්‍යාපන සමාජ විද්‍යාව ද අධ්‍යාපන ක්ෂේත්‍රය හා සම්බන්ධ විවිධ සංසිද්ධි විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීම ඔස්සේ විවිධ සමාජ සංදර්භවල සංවර්ධනය වෙමින් වර්තමානයේ පවතින තත්වයට පත් ව ඇත. අද්‍යතනයෙහි ද සිදු කරමින් පවතින විද්‍යාත්මක අධ්‍යයන නවමු ලෝකයකට මාර්ගය විවර කරමින් පවතී. ඒ අනුව අධ්‍යාපන සමාජ විද්‍යාවේ ආරම්භය හා විකාශනය මෙම පර්යේෂණ ලිපිය ඔස්සේ සාකච්ඡා කිරීමට අපේක්ෂිත ය.

## සාකච්ඡාව

Sociology යන වචනය "socius" සහ "logos" යන ලතින් වචනවලින් සැකසී ඇත. "socius" යන්නෙහි අර්ථය "සහායකයා" යන්නයි. "logos" යන්නෙහි අර්ථය "දැනුම" යන්නයි. ology යන උපසර්ගය අනතුරු ව අගට එකතු වී ඇත. ඒ අනුව Sociology යනු සහායකයන් පිළිබඳ දැනුම හෙවත් සමාජය අධ්‍යයනය කිරීමයි. සමාජ සංසිද්ධි අධ්‍යයනය හා ගවේෂණය කිරීමෙන් සමාජවිද්‍යා විෂය ආරම්භ වූ බව පැහැදිලි ය. මානව සමාජ හැසිරීම් සහ සමාජයේ ස්වභාවය ගවේෂණය කිරීමේ උනන්දුව පුරාතනයේ සිට පැවතුණි. පුරාතන සමාජවල බොහෝ සාමාජිකයෝ ස්වකීය සංස්කෘතිය ස්ථාවර හා දෙවියන් විසින් මිනිසුන්ට දායාද කරන ලද ත්‍යාගයක් ලෙස විශ්වාස

කළහ. මෙම විශ්වාසය 17 වන සියවසේ සිට විශේෂයෙන් බටහිර යුරෝපයේ වඩාත් තාර්කික පැහැදිලි කිරීම් මගින් අනුක්‍රමයෙන් ප්‍රතිස්ථාපනය විය (Rosenberg et al.,1987:06). පුරාණ ග්‍රීක හා රෝම දාර්ශනිකයන්ගේ හා හීබෘ අනාගතවක්තෘවරුන්ගේ කාලයේ පටන් සමාජ විද්‍යාත්මක ප්‍රශ්න හා ගැටලු ඉස්මතු කරමින් සාකච්ඡා කරන ලදී. ශාස්ත්‍රීය වශයෙන් විද්‍යාවක් ලෙස සමාජ විද්‍යාව 19 වන සියවසේ දී (එහි විධිමත් සංස්ථාපිත වර්ෂය 1837 ලෙස සලකයි.) මහා බ්‍රිතාන්‍යයේ සහ බටහිර යුරෝපයේ, විශේෂයෙන් ප්‍රංශයේ හා ජර්මනියේ හට ගත් අතර, එය 19 සහ 20 වන සියවස්වල බෙහෙවින් දියුණු විය.

**සමාජ විද්‍යාවේ පුරෝගාමී සමාජ විද්‍යාඥයින්**

- **ඔගස්ටේ කොම්ට් (Auguste Comte 1798-1857)**

සමාජ විද්‍යාව යන වචන වාක්කෝෂයට එක් කරමින් එම යෙදුම භාවිත කළ පළමු සමාජ දාර්ශනිකයා ප්‍රංශ සමාජ විද්‍යාඥයෙකු වූ කොම්ට් ය (Nobbs, Hine & Flemming,1978:01). සමාජ විද්‍යාඥයෙකු ලෙස සැලකූ පළමු පුද්ගලයා ද විය. ඔහු සමාජ විද්‍යාවේ දී සමාජය ගතික බවත් සමාජ ස්ථිතික විද්‍යාත්මක අධ්‍යයනයක් ලෙසත් නිර්වචනය කළේ ය. ස්වාභාවික විද්‍යාවේ රටා හා ක්‍රියා පටිපාටි අනුගමනය කරමින් සමාජ විද්‍යාව මගින් සමාජය හා සමාජ සංසිද්ධි අධ්‍යයනය කළ හැකි යැයි ඔහු තර්ක කළේ ය. එමෙන් ම සමාජය සංවර්ධනය කිරීම සඳහා සමාජයේ න්‍යායාත්මක විද්‍යාවක් සහ මිනිස් හැසිරීම් ක්‍රමානුකූල ව විමර්ශනය කිරීම අවශ්‍ය බව කොම්ට්ගේ අදහස විය. සමාජයේ නව සොයා ගැනීම් ඔස්සේ දියුණු මානව සමාජයක් සඳහා තීරණාත්මක දායකත්වයක් ලබා දිය හැකි බව ඔහු තර්ක කළේ ය.

- **කාල් මාක්ස් (Karl Marx 1818-1883)**

ජර්මානු සමාජ විද්‍යාඥ මාක්ස් ලෝක ප්‍රකට සමාජ දාර්ශනිකයෙක්, සමාජ විද්‍යාඥයෙකු සහ ආර්ථික ඉතිහාසඥයෙකි. ඔහු සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් විවිධ සමාජ විද්‍යාවල දියුණුවට විශිෂ්ට දායකත්වයක් ලබා දුණි. ඔහු සමාජ විද්‍යාත්මක චින්තනය

නවමු මුහුණුවරකින් සංවර්ධනය කළේ ය. සමාජ විද්‍යාවේ ප්‍රධාන සංකල්ප වන සමාජ පන්තිය, සමාජ පන්ති ගැටුම්, සමාජ පීඩනය, දූරස්ථභාවය යනාදී සංකල්ප මාක්ස්ගේ හඳුන්වා දීම් විය. ඔගස්ට් කොම්ට් වැනි සමාජ ප්‍රතිසංස්කරණ ගෙන ඒමට මිනිසුන් ක්‍රියාකාරී උත්සාහයක් ගත යුතු බව මාක්ස්ගේ අදහස විය. මාක්ස්ට අනුව, සමාජය අවතක්සේරු කිරීමේ හා සමාජ විපර්යාසයේ යතුර ආර්ථික බලවේගය යි. මානව සමාජයේ ඉතිහාසය පන්ති ගැටුම්වල ඉතිහාසය ලෙස ඔහු දැක්වී ය. එක් පන්තියක් තවත් පන්තියකින් සූරා කෑමට හා පීඩාවට පත් නො කරන සියලු පුද්ගලයන් ඔවුන්ගේ හැකියාවන් අනුව කටයුතු කර ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගන්නා, පන්ති රහිත සමාජයක් ඇති කිරීම මාක්ස්ගේ සිහිනය විය. මාක්ස් සමාජ ගැටුම් න්‍යාය ලෙස හඳුන්වන සමාජ විද්‍යාවේ ප්‍රධාන පර්යාවලෝකයක් හඳුන්වා දුන්නේ ය (Giddens, 2009:15).

## ■ හැරියට් මාර්ටිනෝ (Harriet Martineau,1802-1876)

පුරෝගාමී සමාජ විද්‍යාඥයන් අතර සිටි කාන්තා සමාජ විද්‍යාඥවරියක ලෙස බ්‍රිතාන්‍ය සමාජ විද්‍යාඥ හැරියට් හඳුන්වා දිය හැකි ය. හැරියට් එක්සත් ජනපදයේ සහ එංගලන්තයේ අධ්‍යාපනය ලැබූ අතර සමාජ ප්‍රශ්න පිළිබඳ ව ඇය උනන්දුවක් දැක්වූ හෙයින් කොම්ට්ගේ ලේඛන පරිශීලනය කළා ය. වහල්භාවය අහෝසි කිරීම සඳහා ක්‍රියාකාරී උපදේශිකාවක වූ ඇය වාර්ගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය වැනි සංකල්ප ගණනාවක් පිළිබඳ ව සිය ලිපි මගින් අදහස් දැක්වූවා ය. ඇය විවිධ රටවල කළ සංචාර හේතුවෙන් විවිධ සමාජ පිළිබඳ ව ඇගේ දැනුම පුළුල් පරාසයක විය. කොම්ට්ගේ අදහස් සහ ලේඛන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරමින් සමාජවිද්‍යා විෂය ක්ෂේත්‍රයට ඇය විශාල සේවයක් කළා ය (Henslin & Nelson,1995:19).

## ■ හර්බට් ස්පෙන්සර් (Herbert Spencer 1820-1903)

බ්‍රිතාන්‍ය සමාජ දාර්ශනික ස්පෙන්සර් 19 වන සියවසේ සිටි ප්‍රමුඛ පෙළේ සමාජ දාර්ශනිකයෙක් විය. ඔහු මානව සමාජයේ ජෛවීය සමානතාව පිළිබඳ දක්වන ලද අදහස්වලට ප්‍රසිද්ධියක් හිමි විය. සමාජයට අනන්‍ය වූ ව්‍යූහයක් පැවතීම හා ජෛව පද්ධතියට

සමාන අයුරින් ක්‍රියා කිරීම හේතුවෙන් ස්පෙන්සර් සමාජය ජෛවීය පද්ධතියක් ලෙස හැඳින්වී ය. ස්ථාපිත නීති අනුව මානව සමාජයේ පහළ ම ස්වරූපය එනම් "ම්ලේච්ඡත්වයේ'' සිට ඉහළ ම ස්වරූපය වන "ශිෂ්ට සම්පන්න'' තත්වය දක්වා පරිණාමය වීම පිළිබඳ ස්පෙන්සර්ගේ අදහස් සුවිශේෂී වේ. එය "සමාජ ඩාවින්වාදය" ලෙස හැඳින්වූ අතර එය ජීව විද්‍යාත්මක පරිණාමීය ආකෘතියට සමාන ය. සමාජ ඩාවින්වාදය යනු ශාක හා සත්ව සංවර්ධනය පිළිබඳ පරිණාමවාදී න්‍යාය මානව සමාජය හා සමාජ සංසිද්ධි පැහැදිලි කිරීම සඳහා යොදා ගැනීමට දරන උත්සාහය යි (Henslin & Nelson,1995:13).

## ▪ එමිලි ඩර්ක්හයිම් (Émile Durkheim, 1858-1917)

සමාජ විද්‍යාවේ ශාස්ත්‍රීය හා න්‍යායාත්මක සංවර්ධනය පිළිබඳ ප්‍රධාන විශාරදයෙකු ලෙස ප්‍රංශ සමාජ විද්‍යාඥ එමිලි ඩර්ක්හයිම් දැක්විය හැකි ය. ඔහු සමාජ විද්‍යාවේ මූලික මූලධර්ම, ක්‍රම, සංකල්ප සහ න්‍යාය කිහිපයක් ඉදිරිපත් කළේ ය. ඔහු සමාජ විද්‍යාව සමාජ කරුණු අධ්‍යයනය කිරීමක් ලෙස අර්ථ දැක්වී ය. ඔහුට අනුව ජීව විද්‍යාත්මක හා මානසික කරුණුවලින් පරිබාහිර වූ සමාජමය කරුණු පවතී. සමාජමය කරුණු ලෙස යම් සමාජයක සමාජ කණ්ඩායමක් සතු චර්යා රටා අදහස් කරයි. එකී කරුණු විෂය මූලික ව අධ්‍යයනය කළ යුතු ය. ඒ අනුව සමාජ විද්‍යාඥයෙකුගේ කාර්යය සමාජ කරුණු අනාවරණය කරමින් වෙනත් සමාජ කරුණු භාවිත කරමින් එකී සමාජ කරුණු පැහැදිලි කිරීමයි. සමාජ සංසිද්ධි අධ්‍යයනය කිරීම සඳහා සංඛ්‍යානමය ක්‍රමවේදය අනුගමනය කළ පළමු සමාජ විද්‍යාඥයා ලෙස ඩර්ක්හයිම් දැක්විය හැකි ය (Giddens, 2009:14-15).

## ▪ මැක්ස් වෙබර් (Max Weber,1864-1920)

සමාජ විද්‍යාඥයන් අතර ජර්මානු සමාජ විද්‍යාඥ වෙබර් තවත් ප්‍රමුඛ සමාජ විද්‍යඥයෙක් විය. ඔහුට අනුව සමාජ විද්‍යාව යනු මානව සමාජ ක්‍රියාකාරිත්වය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනය යි. සමාජ ක්‍රියාකාරිත්වය යන්නෙන් "වෙනත් පුද්ගලයෙකුට බලපෑම් කිරීමට නැඹුරු වූ ඕනෑ ම ක්‍රියාවක් අදහස් කරයි. ක්‍රියාවක් සමාජ ක්‍රියාවක් ලෙස සැලකීම සඳහා එක් පුද්ගලයෙකුට වඩා වැඩි පිරිසක් භෞතික ව සිටීම අවශ්‍ය නො වේ (Giddens, 2009:19). එය මානව සමාජ

ක්‍රියාකාරී අර්ථකථන පිළිබඳ සැලකිලිමත් වන අතර මිනිසා තමන්ගේ ම ක්‍රියා හා හැසිරීම් පිළිබඳ ව මෙන් ම අන් අයගේ ක්‍රියා කෙරෙහි දක්වන අර්ථය පිළිබඳ ව සැලකිලිමත් වේ. වෙබර් ශාස්ත්‍රීය ග්‍රන්ථ කිහිපයක් ම රචනා කළේ ය. ඔහු බොහෝ මාක්ස්වාදී අර්ථකථනවලට එකඟ වූ නමුත් සමාජ බලවේගයේ කේන්ද්‍රය, ආර්ථික බලවේගය යන අදහස ප්‍රතික්ෂේප කළේ ය. වෙබර් සංඛ්‍යාලේඛන දෙස බැලීමෙන් මිනිස් හැසිරීම තේරුම් ගත නොහැකි බවට තර්ක කරයි. මිනිසුන්ගේ සෑම ක්‍රියාකාරකමක් ම සහ හැසිරීමක් ම අර්ථ නිරූපණය කළ යුතු යැයි ඔහුගේ අදහස විය (Giddens, 2009:19).

## සමාජ විද්‍යාවේ සංවර්ධනය සහ එහි වර්තමාන සන්දර්භය

සමාජ සන්දර්භයෙහි ප්‍රධාන වෙනස්කම් ග්‍රහණය කර ගනිමින් ඒ පිළිබඳව විද්‍යාත්මක ව අධ්‍යයනය කරමින් සමාජ විද්‍යාව විසින් නූතන ලෝකය නව සංස්කරණයකට ලක්කර ඇත. එමෙන් ම ස්විංවුඩ් අනුව සමාජවිද්‍යාව විෂය දහඅට වන සියවසේ පැවති දර්ශනය, ඉතිහාසය, දේශපාලනය, ආර්ථිකය සහ සංස්කෘතිය ඇසුරින් ආරම්භ වී සංවර්ධනය විය (Swingwood,1984:13). ශාස්ත්‍රීය විද්‍යාවක් ලෙස සමාජ විද්‍යාව බිහිවීමට හා සංවර්ධනය වීමට හේතු වූ ප්‍රධාන සාධක ලෙස සමාජීය වෙනස්කම්, නැගිටීම් සහ සමාජ පැසවීම මහා බ්‍රිතාන්‍යයේ ආරම්භ වූ කාර්මික විප්ලවය, 1789 ප්‍රංශ දේශපාලන විප්ලවය, බුද්ධිමත්භාවය සහ ස්වාභාවික විද්‍යාවල දියුණුව සහ තාක්ෂණය දැක්විය හැකි ය. මෙකී විප්ලව ඉහත සඳහන් රටවල පැවති තත් කාලීන සමාජය බිඳ වැටීම් හා සංවර්ධනය කිරීම් ඔස්සේ සැලකිය යුතු සමාජ වෙනස්කම් ඇති කර තිබේ. බටහිර ලෝකයේ පැවති සමාජ-දේශපාලනික, ආර්ථික හා තාක්‍ෂණික විවිධතා මධ්‍යයේ සමාජ විද්‍යාව බිහි වූ අතර එය නූතන සමාජ විද්‍යාව ලෙස හඳුන්වයි.

පුරෝගාමී සමාජ විද්‍යාඥයන් සමාජයේ සිදු වෙමින් පවතින විශාල වෙනස්කම් පිළිබඳ ව සැලකිලිමත් වූ අතර සමාජ සංසිද්ධීන් පාලනය කරන මූලික නීති තේරුම් ගැනීමට, පැහැදිලි කිරීමට, විශ්ලේෂණය කිරීමට සහ අර්ථ නිරූපණය කිරීමට තත්කාලීන විද්‍යාවට නොහැකි බව ඔවුන්ට හැඟුණි. නූතන සමාජ විද්‍යාව මෙම විප්ලවීය සන්දර්භයන්ගෙන් බිහි වුණි. නූතන සමාජ විද්‍යාවේ උප ක්ෂේත්‍ර කිහිපයක් පවතී. ඒ අතර අධ්‍යාපන සමාජ විද්‍යාව සුවිශේෂ වේ.

නූතන සමාජයේ අධ්‍යාපනය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනය පුළුල් පරාසයක පවතින හෙයින් සමාජ විද්‍යාවේ ඇති විශාලතම උප ක්ෂේත්‍රවලින් එකක් ලෙස අධ්‍යාපන සමාජ විද්‍යාව හැඳින්විය හැකි ය. බැලෙන්ටයින් සහ හැමාක්ගේ අර්ථකථනයට අනුව පුද්ගලයා අධ්‍යාපනය සමඟ උපතින් ම බැඳී ඇති අතර මරණය දක්වා අධ්‍යාපනය අවසන් නො වේ (Ballentine & Hammack, 2012:01). අධ්‍යාපනය විධිමත් හෝ අවිධිමත් ලෙස පුද්ගලයෙකුගේ ජීවිත කාලය පුරා ම සිදුවේ. සමාජ විද්‍යාඥයෝ සංවිධානාත්මක හා ක්‍රමානුකූල ව ඉගෙනීම සඳහා සමාජය විසින් නම් කරන ලද විධිමත් ආයතනවල සිදුවන අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරති.

මේ අනුව අධ්‍යාපනය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනය (The Sociological Study of Education) සහ 'අධ්‍යාපන සමාජ විද්‍යාව' (Educational Sociology) යනුවෙන් හඳුන්වන විෂය ක්ෂේත්‍රයට පාසල්, විද්‍යාල, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සහ විශ්වවිද්‍යාල ආදී අධ්‍යාපන අයතනවල අධ්‍යාපනය පිළිබඳ ව අධ්‍යයනයට පමණක් සීමා වේ. මෙම ආයතන මගින් සමාජය විසින් සම්මත දැනුම, කුසලතා සහ සාරධර්ම අනාගත පරපුරට සම්ප්‍රේෂණය කරයි. විධිමත් අධ්‍යාපනය ක්‍රමානුකූල ව හැදෑරූ පළමු සමාජ විද්‍යාඥයෙකු වන එමිල් ඩර්ක්හයිම් (Émile Durkheim) විධිමත් අධ්‍යාපනය යනු සමාජය තමන්ගේ පැවැත්ම සහතික කරන ක්‍රමය බව අර්ථකථනය කළේ ය (Saha, 2001:19–31). මෙයින් අදහස් වන්නේ අධ්‍යාපන ක්‍රියාවලිය බාධාවකින් තොර ව සිදු වන බවත්, අපේක්ෂිත දැනුම හා සාරධර්ම වෙනස් නො වන බවත්, එය තරගයකින් තොර ව සම්මත වන බවත් අදහස් නො වේ. විධිමත් අධ්‍යාපනයෙන් ලබා දිය යුතු දැනුම පිළිබඳ ව සමාජ කිහිපයක් එකඟ වන බවත් ඇතැම් සමාජ එකඟ නොවන බවත් ඩර්ක්හයිම් විසින් අනාවරණය කර ඇත.

සමාජ පංතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය සහ ජාතිය/ ජනවාර්ගික කණ්ඩායම් වැනි සමාජයේ බෙදීම් අනුව දරුවන්ට ලබා දිය යුතු දැනුම පිළිබඳ ව විවිධ අර්ථකථන පවතී. ඒ අනුව ඇතැම් බහු වාර්ගික සමාජවල, සාම්ප්‍රදායික අධ්‍යාපන ප්‍රතිපත්තිය, තත් සමාජය විසින් ප්‍රතික්ෂේප කර ඇත. මෙම ප්‍රතික්ෂේප කිරීම් මගින් විධිමත් අධ්‍යාපන ක්‍රමවේද ස්ථාපිත කිරීමේ දී බොහෝ විට සම්මුතියක් ඇති

කර ගනී. මේ හේතුවෙන් විවිධ වර්ගයේ පාසල් දෙකක් හෝ වැඩි ගණනක් ස්ථාපිත වීමේ සම්භාවිතාවක් ද පවතී. ඒ සෑම පාසලක් ම සුවිශේෂී දැනුමක් හා වටිනාකමක් ඔවුන් වෙත පැමිණෙන සිසුන්ට ලබා දෙයි. බොහෝ රටවල අධ්‍යාපන පද්ධතියෙහි රජයේ පාසල් පද්ධතියක් සහ පෞද්ගලික පාසල් පද්ධතියක් වශයෙන් විවිධ පාසල් පද්ධති පවතින්නේ කවර හෙයින් ද යන්න මෙයින් පැහැදිලි වේ.

**අධ්‍යාපන සමාජ විද්‍යාව**

අධ්‍යාපන සමාජ විද්‍යාව යනු කුමක් දැයි සංක්ෂේප ව අර්ථ දැක්වීමේ දී එය අධ්‍යාපනය සහ සමාජය අතර සම්බන්ධතා අධ්‍යයනය කිරීමක් ලෙස අර්ථ දැක්විය හැකි ය. එය අධ්‍යාපන ආයතනයකට සම්බන්ධ සමාජ විද්‍යාත්මක ක්‍රියාවලි පිළිබඳ විමර්ශනය කිරීමකි. ඔටාවේ දක්වන පරිදි අධ්‍යාපන සමාජ විද්‍යාව සමාජ අධ්‍යයනයක් වන අතර එහි ක්‍රමය විද්‍යාත්මක වනතාක් දුරට එය සමාජ විද්‍යාවේ ශාඛාවකි (Ottaway, 1953: 02).

එය ක්‍රියාත්මක වන සමාජයේ ආර්ථික, දේශපාලන, ආගමික, සමාජ හා සංස්කෘතික බලවේගවලට අදාළ අධ්‍යාපන අරමුණු, ක්‍රමවේද, ආයතන, පරිපාලනය සහ විෂයමාලා සකස් කිරීම පිළිබඳ ව සැලකිලිමත් වේ. අධ්‍යාපන සමාජ විද්‍යාව පුද්ගලයාගේ අධ්‍යාපනය ඔස්සේ පෞරුෂයේ සංවර්ධනය සඳහා සමාජ ජීවිතයේ හා සමාජ සම්බන්ධතාවල බලපෑම ඉස්මතු කර දක්වයි. මේ අනුව, අධ්‍යාපන සමාජ විද්‍යාව මගින් අධ්‍යාපන සංසිද්ධි සහ අධ්‍යාපන ආයතනවල සමාජ විද්‍යාත්මක අංශ සියුම් ව අධ්‍යයනය කරයි. එබැවින් අධ්‍යාපන සමාජ විද්‍යාව අධ්‍යාපන පද්ධතියට සම්බන්ධ සමාජ ක්‍රියාවලි හා සමාජ රටා පිළිබඳ විද්‍යාත්මක විශ්ලේෂණය ලෙස දැක්විය හැකි ය. බෘක්වර් සහ ගොට්ලීබ් අධ්‍යාපනය යනු සමාජ ක්‍රියාවන්ගේ එකතුවක් බවත් සමාජ විද්‍යාව මානව අන්තර් ක්‍රියා විශ්ලේෂණය කිරීමක් බවත් දක්වති. අධ්‍යාපන ක්‍රියාවලිය විධිමත් මෙන් ම අවිධිමත් අවස්ථාවල ද සිදු වේ. අධ්‍යාපනයේ මානව අන්තර්ක්‍රියා පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනය ඔස්සේ අධ්‍යාපන පද්ධතියේ මානව සබඳතා විද්‍යාත්මක ව විශ්ලේෂණය කරමින් අධ්‍යයනය කිරීමේ හැකියාව පවතී (Brookover and Gottlieb, 1961: 38-56).

අධ්‍යාපන සමාජ විද්‍යාව යනු රාජ්‍ය ආයතන සහ පුද්ගල අත්දැකීම් අධ්‍යාපනයට බලපාන ආකාරය සහ එහි ප්‍රතිඵල අධ්‍යයනය කිරීමක් ලෙස ද දැක්විය හැකි ය. පූර්ව ප්‍රාථමික, ප්‍රාථමික, කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ, උසස්, වැඩිදුර, වැඩිහිටි හා අඛණ්ඩ යන අධ්‍යාපන අවධිවල අධ්‍යාපනයේ සංවර්ධනය මෙන් ම නවීන කාර්මික සමාජවල රජයේ පාසල් හා පෞද්ගලික පාසල් පද්ධති විෂයෙහි අධ්‍යාපන සමාජ විද්‍යාව අවධානය යොමු කරයි. එය දාර්ශනික මෙන් ම සමාජ විද්‍යාත්මක සංකල්පයකි. අධ්‍යාපන සමාජ විද්‍යාව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු වන පන්තිකාමරයේ ගුරු-සිසු සබඳතා, සිසු-සිසු අන්තර්ක්‍රියා හා ප්‍රතික්‍රියා පිළිබඳ ව සැලකිලිමත් වෙමින් විෂයමාලාව, ඉගැන්වීමේ ක්‍රම, ඉගෙනුම් ක්‍රම, සංස්කෘතියෙහි සමාජ ප්‍රතිනිෂ්පාදන පිළිබඳ දෘෂ්ටිවාද පිළිබඳ සමාජ විද්‍යා දෘෂ්ටිකෝණයෙන් අධ්‍යයනය කරයි.

අධ්‍යාපන සමාජ විද්‍යාව අධ්‍යාපනය හා සම්බන්ධ සමාජ ක්‍රියාවල එකතුවක් යැයි උපකල්පනය කළ හැකි අතර සමාජ විද්‍යාව ඔස්සේ අධ්‍යාපනය හා සම්බන්ධ මානව අන්තර්ක්‍රියා විශ්ලේෂණය කිරීමක් ලෙස ද දැක්විය හැකි ය. විවිධ රටවල සංවර්ධනයේ විවිධ මට්ටම් අනුව අධ්‍යාපන සමාජ විද්‍යාවේ ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රය විවිධ මට්ටම්වල පවතී. අධ්‍යාපන සමාජ විද්‍යාව එය ස්වාධීන විෂය ක්ෂේත්‍රයක් ද නැතහොත් එය අධ්‍යාපන විද්‍යාවේ හෝ සමාජ විද්‍යාවේ උප අංශයක් ද යන්න දීර්ඝ ව සාකච්ඡා කළ යුතු කරුණකි.

අධ්‍යාපන සමාජ විද්‍යාව නිර්වචනය කිරීමේ දී එය අධ්‍යාපනයේ සාරය පිළිබඳ ව අවධානයට ලක් කරමින් එහි විෂය පථය අනුසාරයෙන් අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කිරීමක් ලෙස ද දැක්විය හැකි ය. අධ්‍යාපනික සමාජ විද්‍යාව අධ්‍යයනය කිරීමට පත්වන විශේෂිත සමාජයේ සංස්කෘතිය, සාරධර්ම සහ සම්මත පිළිබඳ ගැඹුරු පර්යේෂණ මත පිහිටා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා යෝජනා සහ ක්‍රමවේද සපයයි.

උදා- පංති කාමරයේ දුප්පත් සිසුන් හා ධනවත් සිසුන් අන්තර්ක්‍රියා කරන ආකාරය පිළිබඳ පර්යේෂණ කිරීම.

දුප්පත් සිසුන්ට පොහොසත් සිසුන් අසල සිටින විට අනාරක්ෂිත බවක් දැනෙයි. එමෙන් ම එය ඔවුන්ගේ විශ්වාසයට

බලපෑම් එල්ල කළ හැකි අතර ඔවුන්ගේ අධ්‍යයන කටයුතුවලට අයහපත් බලපෑමක් ඇති කළ හැකි ය. එබැවින් අධ්‍යාපනික සමාජ විද්‍යාව විවිධ සමාජ විද්‍යාත්මක න්‍යාය හා ක්‍රමවේද භාවිත කරමින් සමානාත්මතාව පන්ති කාමරයට රැගෙන ඒමට උත්සාහ කරයි. මෙම අධ්‍යයන ඔස්සේ අධ්‍යාපන විද්‍යාඥයන්ට අනාගත අභියෝග සඳහා සූදානම් වීම සහ ක්ෂේත්‍රයේ දියුණුව සඳහා නව ක්‍රියාකාරකම් සැලසුම් කිරීම පහසු කරයි. මේ අනුව, අධ්‍යාපන සමාජ විද්‍යාව යනු අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ ගැඹුරු පරීක්ෂණයක් වන අතර මෙය බොහෝ දුරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළී සිටින පිරිසට ප්‍රතිලාභ ලබා දෙයි.

අධ්‍යාපන සමාජ විද්‍යාව ක්ෂේත්‍රයක් ලෙස විෂය කරුණු ගුරු හා ශිෂ්‍ය අන්තර්ක්‍රියා පෙළ ගැස්වීමේ සිට ඒ ඒ රටවල විශාල අධ්‍යාපන ක්‍රම දක්වා විහිදෙමින් එකී අධ්‍යාපන ක්‍රම අවබෝධ කර ගැනීම විෂයයෙහි උත්සාහවත් ව ඇත (Ballantine at all, 2017: 07). විසි වන සියවසේ මුල් අවධියේ අධ්‍යාපනය පිළිබඳ සමාජ විද්‍යාව විවිධ රටවල සමාජ විද්‍යාඥයන් සහ අධ්‍යාපනඥයන් අතර සාමූහික ප්‍රයත්නයක් වූ අතර එය ඔවුන්ගේ සාමූහික දක්ෂතාවෙන් සමාජය වැඩිදියුණු කිරීම සඳහා වූ කැප වීම මත සිදු කළ හැකි විය (Walters, 2007: 16). එය ඒ ඒ රටවල පවතින ආර්ථික, දේශපාලන හා සමාජ විද්‍යාත්මක තත්වය අනුව රටින් රටට වෙනස් විය. මෙම වෙනස්කම් හේතුවෙන් විවිධ කාල පරාසවල විවිධ ශාස්ත්‍රීය අවබෝධ රටා හා සම්ප්‍රදාය සහිත නොයෙක් රටවල අධ්‍යාපන සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ ක්‍රමානුකූල සංවර්ධනයක් සිදු විය. අධ්‍යාපන විද්‍යාව හා සමාජ විද්‍යාව යන විෂයවල සංකලනයෙන් අධ්‍යාපන සමාජ විද්‍යාව සකස් වී ඇති බවට මතයක් පවතින අතර ඇතැම් විට සමාජ විද්‍යාව විෂය ඔස්සේ අධ්‍යාපන සමාජ විද්‍යාව බිහි වූ බවට ද මතයක් පවතී. එයට ප්‍රතිපක්ෂ ව අධ්‍යාපන විද්‍යාවේ දියුණුවත් සමග අධ්‍යාපන සමාජ විද්‍යාව බිහි වූ බවට ද මත පවතී. ඒ අනුව අධ්‍යාපනික සමාජ විද්‍යාව හා අධ්‍යාපන සමාජ විද්‍යාව ලෙස ව්‍යවහාර දෙකක් පවතී. අධ්‍යාපන සමාජ විද්‍යාව හා අධ්‍යාපනික සමාජ විද්‍යාව න්‍යාය හා පර්යේෂණ ක්‍රම මගින් අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණවලට මෙන් ම සමාජ විද්‍යාත්මක පර්යේෂණවලට වැදගත් දායකත්වයක් ලබා දෙයි.

## අධ්‍යාපනික සමාජ විද්‍යාව (Educational Sociology) හා අධ්‍යාපන සමාජ විද්‍යාව (Sociology of Education)

සමාජ විද්‍යා අධ්‍යයන බොහොමයක් රචිත භාෂාව වන ඉංග්‍රීසි භාෂාවේ අධ්‍යාපන සමාජ විද්‍යාව හැඳින්වීම සඳහා ව්‍යවහාර දෙකක් පවතී. එනම් 'Educational Sociology' සහ 'Sociology of Education' යන ව්‍යවහාර ය. මෙම ව්‍යවහාර සිංහල භාෂාවේ එක ම අර්ථයකින් යුක්ත වුව ද මේ ව්‍යවහාර දෙක පිළිබඳ අවබෝධය අධ්‍යාපන සමාජ විද්‍යාව විෂයය අධ්‍යයනයේ දී අවශ්‍යය ය. මින් ප්‍රමුඛ ව්‍යවහාරය 'අධ්‍යාපනික සමාජ විද්‍යාව' (Educational Sociology) විය හැකි ය. මෙම ව්‍යවහාර දෙක ම ඇතැම් අවස්ථාවල එකිනෙකට වෙනස් ව භාවිත කරයි. 'Educational Sociology' යන අධ්‍යාපනික සමාජවිද්‍යාව යන යෙදුම අධ්‍යාපන විද්‍යා අධ්‍යයන අංශවල අධ්‍යාපන සමාජ විද්‍යාඥයින් විසින් භාවිත කිරීමට නැඹුරු අතර, 'Sociology of Education' අධ්‍යාපනයේ සමාජ විද්‍යාව යන යෙදුම සමාජ විද්‍යා අංශවල සමාජ විද්‍යාඥයන් විසින් භාවිත කිරීමට නැඹුරු ය. මෙකී ප්‍රවේශ දෙකෙහි ම කාර්යභාරය අත්‍යවශ්‍ය ය. මන්ද සමාජ විද්‍යාඥයන් අධ්‍යාපන පද්ධතිවල සත්‍ය හා 'විද්‍යාත්මක' මෙහෙයුම් මෙන් ම ඒවා පරිපාලනය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති ද විසඳිය යුතු බැවිනි (Dworkin et al., 2012: 01).

අධ්‍යාපනයේ සමාජ විද්‍යාව (Sociology of Education) සංකල්පය අධ්‍යාපනික සමාජ විද්‍යාව (Educational Sociology) යන සංකල්පයට වඩා වෙනස් වන අතර එය අධ්‍යාපනයේ පරිපාලනය හෝ ක්‍රියාවලි සඳහා සමාජ විද්‍යාවේ පොදු මූලධර්ම හා සොයා ගැනීම් යොදා ගැනීමක් ලෙස දැක්විය හැකි ය. මෙම ප්‍රවේශය සමාජ විද්‍යාවේ මූලධර්ම අධ්‍යාපන ආයතනවල වෙන ම සමාජ ඒකකයක් ලෙස සම්බන්ධ කිරීමට උත්සාහ කරයි. අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් ව්‍යුත්පන්න වූ අභියෝග අධ්‍යාපනික සමාජ විද්‍යාවේ දී සාකච්ඡා කරයි. එබැවින් අධ්‍යාපන සමාජ විද්‍යාවේ 'Sociology of Education' අන්තර්ගතයට සමාජය, ජීවත් වන ස්ථානය, සංස්කෘතික පසුබෑම, උප සංස්කෘතිය, තත්වය වැනි පොදු සංකල්ප ඇතුළත් වේ. සමාජ පංතිය, සංස්කෘතිය සහ භාෂාව අතර සම්බන්ධතාව, අධ්‍යාපනය සහ රැකියාව අතර සම්බන්ධතාව, ප්‍රජාතන්ත්‍රීයකරණයේ සහ ප්‍රභූවාදයේ ගැටලු සියල්ල ම අධ්‍යාපන සමාජ විද්‍යාවේ විෂය පථයට අයත් ය.

ආධ්‍යාපනික සමාජ විද්‍යාව (Educational Sociology) යනු සමාජය හා අධ්‍යාපනය අතර සම්බන්ධතාවෙහි ගැටලු අධ්‍යයනය කරන සමාජ විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයකි. එය අධ්‍යාපනයේ අනාගත කාර්යය සඳහා අධ්‍යාපනඥයන් සූදානම් කිරීම සඳහා නිර්මාණය කරන ලද විෂය ක්ෂේත්‍රයක් ලෙස පරිණාමය විය. අධ්‍යාපන ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී සහ මෙම සැලසුම් සාක්ෂාත් කර ගැනීමේ ඵලදායී ක්‍රම සංවර්ධනය කිරීමේ දී සමාජ විද්‍යාත්මක පර්යේෂණවල ප්‍රතිඵල භාවිත කරයි. අධ්‍යාපනික සමාජ විද්‍යාවේ ප්‍රධාන අරමුණ අධ්‍යාපනයේ දී සමාජ අන්තර්ක්‍රියා අධ්‍යයනය කිරීම යි. අධ්‍යාපනික සමාජ විද්‍යාව සමාජ විද්‍යාවේ පොදු මූලධර්ම හා සොයා ගැනීම් අධ්‍යාපන ක්‍රියාවලියට අදාළ වන විෂය ක්ෂේත්‍රවල අධ්‍යයනය කිරීමක් ලෙස අර්ථ දැක්විය හැකි ය.

ඉහත අර්ථ දැක්වීම්වලට අනුව අධ්‍යාපනික සමාජ විද්‍යාව යනු අධ්‍යාපනය, සමාජ විද්‍යාත්මක ව අධ්‍යයනය කරන විෂය ක්ෂේත්‍රයකි. එය අධ්‍යාපනය සමාජයේ පවතින දෙයක්, ක්‍රියාවලියක් හා ආයතනයක් ලෙස පිළිගනිමින් සමාජීය ක්‍රියාකාරිත්වයක් ඇති දෙයක් ලෙස තීරණ ගනු ලබයි. එහිදී අධ්‍යාපන පද්ධතියක පවතින ගැටලු විසඳීම සඳහා සමාජ විද්‍යාත්මක මූලධර්ම හා ක්‍රමවේද යොදා ගනියි. අධ්‍යාපනික සමාජ විද්‍යාව පුද්ගලයකු සමාජයේ විවිධ කොටස් සමග අන්තර් ක්‍රියාකාරිත්වයේ වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබා දෙයි. අධ්‍යාපනික සමාජවිද්‍යාව අධ්‍යාපන සාධනය තුළින් සමාජයේ ප්‍රගතිය අවධාරණය කරයි. එහිදී ශික්ෂණවේදයේ පවතින ගැටලු හා ඉගෙනීම සමාජයේ කෘත්‍යයක් ලෙස සලකනු ලබයි. අධ්‍යාපනික සමාජ විද්‍යාව - කුමන ආකාරයේ අධ්‍යාපනයක් ලබා දිය යුතු ද? විෂයමාලාව කුමක් විය යුතු ද? ළමයින් වැරදිකරුවන් වන්නේ ඇයි? යන ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා අධ්‍යාපන ක්‍රියාවලියේ දී වැදගත් වූ සමාජ අන්තර්ක්‍රියා පිළිබඳ ව එම සමාජ හා සංවිධාන පිළිබඳ ව අධ්‍යයනය කරමින් එහි පවතින වාස්තවික යථාර්ථය පිළිබඳ අවබෝධය පුළුල් කරයි. අධ්‍යාපනික සමාජවිද්‍යාව පුද්ගලයා වඩා හොඳ සමාජ ජීවියෙකු බවට පත් කිරීමට අවශ්‍ය ඔහුගේ පෞරුෂත්වය සංවර්ධනය කිරීමට උපකාරී වන අධ්‍යාපනික අන්තර්ක්‍රියා පිළිබඳ අධ්‍යයනය කරයි. අධ්‍යාපනික සමාජ විද්‍යාව සෑම ශිෂ්‍යයෙකුගේ ම අධ්‍යාපනයේ සමාජ ස්වභාවය අවබෝධ කර ගැනීමට පහසු කරයි.

එමෙන් ම අධ්‍යාපන සැලසුම්කරණයේ දී අධ්‍යාපන සමාජ විද්‍යාවේ මාන කුමක් විය යුතු ද යන්න පිළිබඳ ව පරමාදර්ශ සකස් කිරීමේ දී සමාජ විද්‍යාඥයින් හෝ අධ්‍යාපන සමාජ විද්‍යාඥයින් විසින් කරන ලද පූර්ව පර්යේෂණ මගින් රැස් කරන ලද න්‍යායාත්මක දැනුම භාවිත කරයි. අධ්‍යාපනික සමාජ විද්‍යා ශීර්ෂය යටතේ වර්ගීකරණය කළ යුතු පර්යේෂණ මොනවා ද යන්න පිළිබඳ ව විවිධ මත පැවතුණි. අධ්‍යාපනයේ සමාජ විද්‍යාව ලෙස නම් කළ හැකි වෙන ම දැනුමේ ශාඛාවක් තිබිය යුතු ය යන චින්තනයට මෙය හේතු විය. වැඩි කල් නොගොස් අධ්‍යාපන සමාජ විද්‍යාව ඓතිහාසික ප්‍රපංචයක් බවට පත් විය.

එය 1963 දී අධ්‍යාපනික සමාජ විද්‍යාව පිළිබඳ එක්සත් ජනපදයේ පළමු ජර්නලය වූ 'The Journal of Educational Sociology' ජර්නලයේ මාතෘකාව සඳහා භාවිත කරන ලද නාමය විය. මෙම සඟරාව නිල වෘත්තීය ශාස්ත්‍රීය සමාජ විද්‍යා සංගමය වන ඇමරිකානු සමාජ විද්‍යා සංගමය (ASA) විසින් ප්‍රකාශ කරන ලදි. එහෙත් එම නම පසුව 'The Journal of Sociology of Education' (අධ්‍යාපන සමාජ විද්‍යාව පිළිබඳ ජර්නලය) ලෙස වෙනස් කරන ලදි. මේ අනුව අධ්‍යාපනික සමාජ විද්‍යාව (Educational Sociology) අධ්‍යාපන සමාජ විද්‍යාව (Sociology of Education) යන ව්‍යවහාරය මගින් අධ්‍යාපන පද්ධතියට සම්බන්ධ සමාජ ක්‍රියාවලි හා සමාජ රටා පිළිබඳ විද්‍යාත්මක විශ්ලේෂණය කරන බව දැක්විය හැකි ය. එය නූතන අධ්‍යාපනයේ සංවර්ධනයට මනා පිටුබලයක් ලබා දෙයි.

### අධ්‍යාපන සමාජ විද්‍යාවේ ප්‍රගමනය සඳහා ඉවහල් වූ න්‍යාය

සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ අනාවරණය කරන ලද න්‍යාය පරීක්ෂා කරමින් එහි අඛණ්ඩ සංවර්ධනය සඳහා අධ්‍යාපන සමාජ විද්‍යාව විශාල දායකත්වයක් සපයයි. එමිල් ඩර්ක්හයිම් (Émile Durkheim) අධ්‍යාපන සමාජ විද්‍යාවේ නිර්මාතෘවරයා හෙවත් පියා ලෙස හඳුන්වයි. ඔහු සමාජයේ සංස්කෘතික හා සමාජ පිළිවෙළ නව පරපුරට සම්ප්‍රේෂණය කරන පද්ධතියක් ලෙස අධ්‍යාපනය සමාජ විද්‍යාවට සංකල්පීයකරණය කර ඇත. එමෙන් ම අධ්‍යාපන සමාජ විද්‍යාව කාල් මාක්ස් සහ වෙබර්ගේ දායකත්වයෙන් සංකල්පීය හා

න්‍යායාත්මක රාමුවක් ලබා ගනියි. කාල් මාක්ස්ගේ ගැටුම් න්‍යායයට (Conflict theory) අඩිතාලම දැමූ අතර පසුකාලීන ගැටුම් න්‍යායවාදීන් විසින් රාජ්‍යයේ පන්ති තත්ත්ව ප්‍රතිනිෂ්පාදනය හා පවත්වා ගෙන යාමේ දී අධ්‍යාපනයේ දෘෂ්ටිවාදාත්මක භූමිකාව ගවේෂණය කර ඇත. වෙබර් විසින් සමාජ විද්‍යාවේ ව්‍යුහය, මානව නියෝජනය, ද්‍රව්‍ය හා ප්‍රමිති ඒකාබද්ධ කරන බහුමානීය ප්‍රවේශයක් ඉදිරිපත් කළේ ය. මෙම මුල් අත්තිවාරම මත පදනම් ව, පසු කාලීන ව න්‍යාය කිහිපයක් බිහි විය. ව්‍යුහාත්මක ගැටුම් න්‍යාය අතර, පියරේ බෝර්ඩියු ඉදිරිපත් කළ (Pierre Bourdieu, 1984), ප්‍රායෝගික න්‍යාය (theory of practice), බැසිල් බර්න්ස්ටයින් ඉදිරිපත් කළ (Basil Bernstein,1996) භාෂා කේත න්‍යාය (theory of language codes) සහ රැන්ඩල් කොලින්ස් ඉදිරිපත් කළ (Randall Collins,1979) වෙබේරියානු සමාජ බැහැර කිරීමේ න්‍යාය (Weberian theory of social exclusion) සමකාලීන අධ්‍යාපන සමාජ විද්‍යාවට විශාල බලපෑමක් කර ඇත.

බෝර්ඩියු ඉදිරිපත් කළ ප්‍රායෝගික න්‍යායයට අනුව සමාජ ලෝකය සමන්විත වන්නේ සමුච්චිත වීමේ ඉතිහාසයෙනි. සමාජ හා සංස්කෘතික ප්‍රතිනිෂ්පාදනයේ කොටසක් ලෙස අධ්‍යාපනය සංස්කෘතික ප්‍රාග්ධනය (සිසුන්ගේ සමාජ සැකසුම් හා සජීවී අත්දැකීම්වලින් ලබා ගත් ලෝකය පිළිබඳ දැනුම ලබා දෙන අවස්ථා මත පදනම් වූ ප්‍රාග්ධනය) හා සිසුන් අතර ඇති සමාජ වෙනස්කම් සමග සම්බන්ධ වේ (Murdock, 2010: 64). ඒ හා සමාන ව, බර්න්ස්ටයින්ගේ කේත න්‍යායයේ දී (Code theory) ඔහු කම්කරු පන්තියේ සිසුන්ගේ ක්‍රියාකාරිත්වය ගවේෂණය කරන අතර සමාජානුයෝජනය පන්තිය මත පදනම් ව සිදු වන බව තර්ක කරයි. භාෂාව හා සංස්කෘතියට අමතර ව ප්‍රධාන පාසල් ශික්ෂණවේදය පන්ති අතර සමාජ වෙනස්කම් උත්පාදනය කරයි (Bernstein, 1975: 148-149).

කොල්මන්ගේ දැක්ම අනුව, මානව ප්‍රාග්ධනය ගොඩ නැගීමේ දී, විශ්වාසය සහ ප්‍රජාව මත පදනම් වූ සමාජ ප්‍රාග්ධනය (උදා: සිසුන්ගේ පවුල් සහ ප්‍රජාව සමග පාසලේ සම්බන්ධතාව) ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. සමාජ ප්‍රාග්ධනය එහි ක්‍රියාකාරිත්වය අනුව අර්ථ දැක්වේ. එය තනි වස්තුවක ස්ථිතියක් නො ව විවිධාකාර වූ වස්තූන්ගේ ස්ථිතියකි, එහි මූලධර්ම දෙකකි. එනම් ඒවා සියල්ල

ම සමාජ ව්‍යූහයේ යම් අංශයකින් සමන්විත ය. සමාජ ව්‍යූහයෙහි පුද්ගලයන්ගේ හෝ ආයතනික ක්‍රියාකාරීන්ගේ ඇතැම් ක්‍රියාවන්ට ඒවා පහසුකම් සපයයි. භෞතික ප්‍රාග්ධනය සහ මානව ප්‍රාග්ධනය මෙන්, සමාජ ප්‍රාග්ධනය මුළුමනින් ම සමාන නොවන නමුත් ඇතැම් ක්‍රියාකාරකම්වලින් සමාන විය හැකි ය (Coleman, 1988: 98). සමාජ ප්‍රාග්ධනය යනු සමාජ සම්පත් සහ පවුල් සම්බන්ධතා අධ්‍යාපනික වශයෙන් ශිෂ්‍ය සාධනයට බලපෑම් කිරීමයි. අධ්‍යාපනයට සම්බන්ධ එවැනි ද්‍රව්‍යමය හා ද්‍රව්‍යමය නොවන සම්පත් මගින් අධ්‍යාපන අවස්ථාවල වෙනස් වීම් ඇති කිරීම සමාජ ප්‍රාග්ධනය යි. එමෙන් ම අධ්‍යාපන ප්‍රතිපත්ති මගින් එවැනි වෙනස්කම්වලට බලපෑම් කිරීමේ අවස්ථා අධ්‍යාපන සමාජ විද්‍යාව විවෘත කර තිබේ. සංකේතාත්මක අන්තර් ක්‍රියාකාරීවාදය සහ සමාජ සංස්කරණවාදය අධ්‍යාපන සමාජ විද්‍යාවේ ප්‍රධාන ක්‍රියාකාරී න්‍යාය බවට පත් වී ඇති අතර විශේෂයෙන් ඔවුන් අන්තර් ක්‍රියා කෙරෙහි අවධානය යොමු කරයි. විගොට්ස්කිගේ සංජානනය පිළිබඳ සමාජ-සංස්කෘතික ප්‍රවේශයට අනුව, ඉගෙනීම ඉගෙනුම ලබන්නා සහ සමාජ පරිසරය අතර අන්තර් ක්‍රියාකාරීත්වය මත රඳා පවතී. මෙයට සම වයසේ මිතුරන් මෙන් ම දෙමාපියන් සහ ගුරුවරුන් ද ඇතුළත් වේ. ඩෙමනෙට් සහ වැන් හෝට් විරුද්ධ සංස්කෘතික න්‍යායයෙන් (Oppositional Culture Theory) පාසල්වල විෂමාචාරය සහ ඔවුන්ගේ පාසල් පරිසරයේ සහ ඉන් පිටත සිසුන්ගේ නිෂ්ඵලභාවයේ (අහේතුවාදී) හැඟීම් ඇති වීමට හේතු සාකච්ඡා කරමින් නවෝත්පාදනය විශ්ලේෂණය කරයි (Demanet and Van Houtte, 2011: 229). එමෙන් ම අන්තර්ක්‍රියා න්‍යායයේ සංවර්ධනයට දායක වන මයිකල්සන් පන්ති කාමරවල පිරිමි ළමයින් හා ගැහැනු ළමයින්ගේ අන්තර්ක්‍රියාවල පුම්තිරි භේදය සහ පුම්තිරි බවෙහි වෙනස්කම් ඔවුන්ගේ අත්දැකීම්වලට බලපාන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කරයි (Mickelson, 2012: 318).

අධ්‍යාපන සමාජවිද්‍යාවේ නවීන හා පශ්චාත් නූතන න්‍යාය ද පවතී. චීන භාෂාවෙන් රචිත තායිවාන සමාජ විද්‍යාවේ ස්ත්‍රීවාදය, පශ්චාත් නූතනවාදය, වෙබීරියානු න්‍යාය, ප්‍රජනන න්‍යාය, ප්‍රතිරෝධක න්‍යාය, විවේචනාත්මක න්‍යාය, නාට්‍යමය න්‍යාය, ව්‍යුහාත්මක න්‍යාය ඇතුළු න්‍යායය සියල්ල ම සමාලෝචනය කර ඇත (Chang and Renjie, 2003: 211-231). පාසල් පද්ධතියෙහි අධ්‍යාපනික ධනාත්මකවාදය,

අධ්‍යාත්මිකවාදය, මානවවාදය, සාමාන්‍යවාදය සහ මානව ප්‍රාග්ධන න්‍යායයන් වැනි දාර්ශනික හා අධ්‍යාපනික අදහස්වල මිශ්‍රණයක් පිළිබිඹු වේ. මෙකී න්‍යාය අධ්‍යාපනයේ න්‍යායට හා පර්යේෂණවලට ද විද්‍යාත්මක පසුබිම් සපයයි.

## අධ්‍යාපන සමාජ විද්‍යාව හැදෑරීමේ අවශ්‍යතාව

සෑම සමාජයකට ම අනන්‍ය වූ ගතික සමාජ-සංස්කෘතික අවශ්‍යතා පවතින අතර මෙම අවශ්‍යතා සපුරාලීම සඳහා අධ්‍යාපනය අවශ්‍ය ය. නූතන සමාජ අවශ්‍යතා ලෙස සම්පත් සංරක්ෂණය, පාරිසරික ආරක්ෂාව, ගෝලීය පුරවැසිභාවය යනාදිය දැක්විය හැකි ය. එබැවින් අධ්‍යාපනය මෙකී විවිධ අවශ්‍යතා සපුරාලීමට උපකාරී වේ. සමාජයේ අවශ්‍යතා නිරන්තරයෙන් වෙනස් වන හෙයින් අධ්‍යාපනය ද වෙනස් වේ. එබැවින් අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රතිසංස්කරණවල දී අධ්‍යාපන සමාජ විද්‍යාවේ සුවිශේෂී දායකත්වයක් පවතී. අධ්‍යාපන සමාජ විද්‍යාව අධ්‍යාපනය හා සම්බන්ධ විවිධ සාමාජීය සාධක අවබෝධ කර ගැනීමට ඉවහල් වේ.

- පාසල් හා ගුරුවරුන්ගේ කටයුතු සමාජ ප්‍රගතිය සහ සංවර්ධනයට සම්බන්ධ වන ආකාරය
- පාසලේ හා සමාජයේ ක්‍රියාකාරීත්වයට සමාජ මූලිකාංගවල බලපෑම
- පුද්ගලයන්ගේ ජීවිතයට සමාජ මූලිකාංගවල බලපෑම
- සමාජයේ සංස්කෘතික හා ආර්ථික අවශ්‍යතා සම්බන්ධයෙන් විෂයමාලා ගොඩ නැගීම
- විවිධ රටවල පවතින ප්‍රජාතන්ත්‍රවාදී මතවාද
- ජාත්‍යන්තර සංස්කෘතිය අවබෝධ කර ගැනීම හා ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව
- සංස්කෘතිය හා සම්ප්‍රදාය අවබෝධ කර ගැනීම ඔස්සේ විවිධ නීති-රීති සම්පාදනය කිරීම මගින් සමාජය සංවර්ධනය කිරීම

- සමාජ සැකසුම ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව

- සමාජ කණ්ඩායම්වල අන්තර් සම්බන්ධතාව සහ පුද්ගලයන්ගේ ගති ස්වරූප අතර හේතුඵල සම්බන්ධය (Satapathy, 2012: 17) අධ්‍යයනය කිරීම වැනි අධ්‍යාපනය හා සම්බන්ධ සමාජීය ශාඛා අවබෝධ කර ගැනීමට අධ්‍යාපන සමාජ විද්‍යාව හැදෑරීම අවශ්‍ය වෙයි.

**අධ්‍යාපන සමාජ විද්‍යාවේ විෂය පථය**

අධ්‍යාපනයේ සමාජ විද්‍යාවේ පුළුල් වූ විෂය පථයක් පවතින අතර එය කාලීන ව සිදුවන සමාජීය විපර්යාස සමග විවිධ මුහුණුවර ගනී.

- සමාජය, සංස්කෘතිය, ප්‍රජාව, පංතිය, පරිසරය, සමාජීයකරණය, අභ්‍යන්තරකරණය, නවාතැන්, උකහා ගැනීම, සංස්කෘතික පසුබෑම, උප සංස්කෘතිය, තත්වය, භූමිකාව වැනි පොදු සංකල්ප විෂයයෙහි සැලකිලිමත් වේ.

- අධ්‍යාපන සමාජ විද්‍යාව අධ්‍යාපනය, සමාජ පංතිය, රාජ්‍යය, සමාජ බලය, සංස්කෘතික වෙනස, භූමිකා ව්‍යූහයේ විවිධ ගැටලු, සමස්ත සමාජ පද්ධතියට අදාළ භූමිකා විශ්ලේෂණය සහ පාසලේ තේමාත්මක සමාජය, අධිකාරිය, ඉගෙනීම තෝරා ගැනීම සහ සංවිධානය කිරීම, විෂයමාලාව සංවිධානය සහ එහි ගලා යෑම යනාදිය අධ්‍යයනය කරයි.

- විවිධ භූගෝලීය හා ජනවාර්ගික සන්දර්භවල අධ්‍යාපන තත්ව විශ්ලේෂණය කිරීම උදා. ග්‍රාමීය, නාගරික, ගෝත්‍රික ප්‍රදේශවල, රටේ/ලෝකයේ විවිධ ප්‍රදේශවල, විවිධ ජාති, සංස්කෘති යනාදී පසුබිම් සහිත අධ්‍යාපන තත්වය අධ්‍යයනය කිරීම.

- විවිධ ආකාරයේ බුද්ධිමත් සිසුන්ට ඉගැන්වීමේ දී විවිධ

අධ්‍යාපන ක්‍රමවේදවල ඵලදායීතාව අවබෝධ කර ගැනීමට අධ්‍යාපන සමාජවිද්‍යාව අධ්‍යයනය කිරීම උපකාරී වේ.

- නාගරික පාසල්වල සපයනු ලබන අධ්‍යාපනය සඳහා සිසුන්ට ලබා දෙන අධ්‍යාපන වර්ගය මත ආර්ථිකයේ බලපෑම අධ්‍යයනය කිරීම.
- පවුල, පාසල වැනි විවිධ සමාජ ආයතනවල බලපෑම සිසුන්ට බලපාන ආකාරය තේරුම් ගැනීමට අධ්‍යාපන සමාජවිද්‍යාව උපකාරී වේ.
- අධ්‍යාපන සමාජවිද්‍යාව සමාජ පන්තිය, සංස්කෘතිය, භාෂාව, දෙමාපිය අධ්‍යාපනය, රැකියාව සහ සිසුන්ගේ සාධනය අතර සම්බන්ධතාව අධ්‍යයනය කරයි.
- සිසුන්ගේ පෞරුෂත්වය පිළිබඳ සම වයස් කණ්ඩායම්වල හා පාසලේ කාර්යභාරය සහ ව්‍යූහය අධ්‍යයනය කරයි.
- ජාතිවාදය, ජාතිකවාදය, ආගම්වාදය, ස්ත්‍රී පුරුෂ භාවය වෙනස් කිරීම වැනි ගැටලු පිළිබඳ අවබෝධයක් අධ්‍යාපන සමාජවිද්‍යාව ලබා දෙයි (Satapathy, 2012: 13-14).

**නිගමනය**

අධ්‍යාපන සමාජවිද්‍යාව සම්බන්ධ ව සාකච්ඡා කිරීමේ දී එහි ප්‍රභවය ලෙස සමාජ විද්‍යාව හඳුන්වා දිය හැකි ය. සමාජ විද්‍යාව විෂය ක්ෂේත්‍රය අනාදිමත් කාලයක් පුරා සංවර්ධනය වෙමින් පැවති බවත් එහි විද්‍යාත්මක සංවර්ධනය දාහත් වන සියවසේ දී ආරම්භ වූ බවත් පැහැදිලි ය. ඒ සඳහා පුරෝගාමී ව කටයුතු කළ සමාජ විද්‍යාඥයින් ලෙස ප්‍රංශ සමාජ විද්‍යඥ ඔගස්ටේ කොම්ටේ, ජර්මානු සමාජ විද්‍යඥ කාල් මාක්ස්, බ්‍රිතාන්‍ය සමාජ විද්‍යඥ හැරියට් මාටිනෝ, බ්‍රිතාන්‍ය සමාජ විද්‍යාඥ හර්බට් ස්පෙන්සර්, ප්‍රංශ සමාජ විද්‍යාඥ එමිලි ඩර්ක්හයිම්, ජර්මානු සමාජ විද්‍යාඥ මැක්ස් වෙබර් හඳුන්වා දිය හැකි ය. ඔවුන්ගේ අර්ථකථන අනුව සමාජ විද්‍යාව යනු සමාජයේ විද්‍යාවක් වන අතර එය සමාජ කණ්ඩායම්, සමාජ සම්බන්ධතා,

මානව අන්තර්ක්‍රියා, සමාජ සංසිද්ධිය හා සමාජ ක්‍රමය නූතන සමාජය ආශ්‍රයෙන් විද්‍යාත්මක අධ්‍යයනය කිරීමකි. සමාජ විද්‍යාවේ සංවර්ධනය සමග එය විවිධ උප ක්ෂේත්‍ර ගණනාවක් නිර්මාණය කර ඇති අතර වර්තමානයෙහි අධ්‍යාපනය පිළිබඳ සමාජ විද්‍යාව ස්වාධීන විෂය ක්ෂේත්‍රයක් බවට පරිවර්තනය වෙමින් පවතී. එය සමාජයේ ආර්ථික, දේශපාලනික, ආගමික, සාමාජික හා සංස්කෘතික බලවේගයන්ට අදාළ අධ්‍යාපන අරමුණු, ක්‍රමවේද, අධ්‍යාපන ආයතන පරිපාලනය සහ විෂයමාලා සකස් කිරීම පිළිබඳ ව සැලකිලිමත් වන අතර අධ්‍යාපන පද්ධතියට සම්බන්ධ සමාජ ක්‍රියාවලි හා සමාජ රටා පිළිබඳ විද්‍යාත්මක විශ්ලේෂණයක යෙදෙයි. අධ්‍යාපන සමාජ විද්‍යාව හා අධ්‍යාපනික සමාජ විද්‍යාව වශයෙන් ව්‍යවහාර දෙකක් පැවතුණ ද මෙකී ව්‍යවහාර දෙක ම අධ්‍යාපනය හා සම්බන්ධ සංසිද්ධි අධ්‍යයනය කරයි. අධ්‍යාපන සමාජ විද්‍යාවේ ප්‍රගමනය සඳහා ඉවහල් වූ න්‍යාය ලෙස කාල් මාක්ස්ගේ ගැටුම් න්‍යාය, පියරේ බෝර්ඩියුගේ ප්‍රායෝගික න්‍යාය, බැසිල් බර්න්ස්ටයින්ගේ භාෂා කේත න්‍යාය, රැන්ඩල් කොලින්ස්ගේ වෙබේරියානු සමාජ බැහැර කිරීමේ න්‍යාය, කේත න්‍යාය, විරුද්ධ සංස්කෘතික න්‍යාය යන න්‍යාය ඉවහල් වී ඇති බව පැහැදිලි ය. අධ්‍යාපන සමාජ විද්‍යාව හැදෑරීම අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රතිසංස්කරණවල දී අවශ්‍ය වේ. අධ්‍යාපන සමාජ විද්‍යාව අධ්‍යාපනය හා සම්බන්ධ විවිධ සාමාජීය සාධකවල ක්‍රියාකාරීත්වය අවබෝධ කර ගැනීමට ඉවහල් වේ. අධ්‍යාපන සමාජ විද්‍යාවේ විෂය පථය ලෙස අධ්‍යාපනය හා සම්බන්ධ සමාජය, සංස්කෘතිය, ප්‍රජාව, පංතිය, පරිසරය, සමාජීයකරණය, අභ්‍යන්තරකරණය, උප සංස්කෘතිය, තත්ත්වය, භූමිකාව ආදී සංකල්ප හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ ව ප්‍රායෝගික ව අධ්‍යයනය කරනු ලබයි. මේ අනුව අධ්‍යාපන සමාජ විද්‍යාවේ ආරම්භය හා විකාශනය ක්‍රමානුකූල ව සිදු වී ඇති ආකාරය මනාව අවබෝධ කර ගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Ballantine, J. H., Hammack, F. M., and Stuber, J. (2017). *The Sociology of Education: A Systematic Analysis*. Newyork: Routledge. (Retrieved May 15, 2021 from https://www.taylorfrancis.com/books)

Ballentine, J. H., and Hammack , F' M., (2012). *The Sociology of Education*: *A Systematic Analysis*. Pearson, Boston. (Retrieved May 15, 2021 from https://books.google.lk/)

Bernstein, B. (1975). *Class, Codes and Control 3*. London: Routledge and Kagan Paul. (Retrieved May 15, 2021 from https://anekawarnapendidikan.files.wordpress.com).

Brookover,W. B. and Gottlieb, D. (1961). *Sociology of Education, Review of Educational Research,Vol. 31, No. 1, The Philosophical and Social Framework of Education,* Published By: American Educational Research Association, (Retrieved May 15, 2021 from https://doi.org)

Chang, J.C. and Renjie Z. (2003). *Constructing the sociology of education as a unique discipline*: The cases of mainland China and Taiwan. In: Torres CA and Antikainen A (eds) The International Handbook on the Sociology of Education. Lanham, MD: Rowman and Littlefield, pp. 211–31. (Retrieved May 12, 2021 from https://books.google.lk)

Coleman, J.S. (1988). *Social capital in the creation of human capital.* American Journal of Sociology 94. (Retrieved May 15, 2021 from https://www.socialcapitalgateway.org/content)

Demanet, J. and Van Houtte M. (2011). *Social-ethnic school composition and school misconduct: Does sense of futility clarify the picture? Sociological Spectrum* 31(2): 224–256.

Dworkin at all, (2012). *The sociology of education*, Editorial Arrangement of Sociopedia.isa (Retrieved May 15, 2021 from https://www.academia.edu)

Giddens, A. (1996). *Sociology*. 6th Edition.London: Macmillan, (Retrieved May 15, 2021 from https://www.academia.edu)

Henslin, J. M. and Nelson, A. (1995). *Sociology: A Down-to-Earth Approach*. Canadian Edition. Scarborough, Ontario: Allyn and Bacon, (Retrieved May 15, 2021 from https://books.google.lk/)

Mickelson, R.A. (2012). *Gender and education*. In: Ballantine JH and Spade JZ (eds) Schools and Society, 4th edn. Thousand Oaks, CA: Sage. (Retrieved May 12, 2021 from https://assets.thalia.media)

*Distinction: a social critique of the judgement of taste*, by Pierre Bourdieu/ translated by Richard Nice, Cambridge, MA, Harvard University Press, 1987, 640 pp., paperback, ISBN 0-67-421277-0

Murdock, G.,(2010). *Distinction: a social critique of the judgement of taste*, by Pierre Bourdieu/translated by Richard Nice, Cambridge, MA, Harvard University Press, 1987, (Retrieved May 12, 2021 from https://www.researchgate.net/publication)

Nobbs, J., Hine, B. and Fleming,M. (1978). *Sociology*. (No place): Macmillan Education, (Retrieved May 15, 2021 from http://aptcrtm.in/databank)

Ottaway (1953). *Education and Society: An Introduction to the Sociology of Education*. (Retrieved May 14, 2021 from https://books.google.lk)

Rosenberg, Michael, et al. (1987). *An Introduction to sociology*. Second Edition. Toronto New York: Methuen. (Retrieved May 15, 2021 from https://www.cartercenter.org)

Saha, L.J., (2001). *Durkheim's sociology of education: a critical assessment. Education and Society 19* (2), 19–3. (Retrieved May 15, 2021 from https://www.researchgate.net)

Satapathy, S.S., (2019). *Sociology of Education*. (Retrieved May 15, 2021 from http://ddceutkal.ac.in)

Swingwood, A., (1984). *A Short History of Sociological Thought*. London: McMillan, (Retrieved May 16, 2021 from https://books.google.lk)

Walters, P. B. (2007). *Betwixt and between discipline and profession: A history of sociology of education. History of Sociology in America*. (Ed. C. Calhoun): University of Chicago Press: Chicago. (Retrieved May 15, 2021 from http://libgen.li)